ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**<u>ශ්‍රී ලංකාවේ ආරම්භක සමාගම් ඉන්වෙස්ට් ඉන්ඩියා සහ ජාත්‍යන්තර සූර්යබල සන්ධානයේ SolarX Startup Challenge හි ජයග්‍රහණ රැසක් හිමි කර ගනී</u>**

ශ්‍රී ලංකාව SolarX Startup Challenge (ආසියා-පැසිෆික් කලාපය) හි වැඩිම ජයග්‍රාහකයන් සංඛ්‍යාවක් බිහි කළ රට බවට පත් විය. මෙම අභියෝගය ජාත්‍යන්තර සූර්ය බල සන්ධානය විසින් ඉන්වෙස්ට් ඉන්ඩියා සමඟ සහයෝගයෙන් COP 28 හිදී දියත් කරන ලද අතර එහි අරමුණ වන්නේ සූර්ය බල ක්ෂේත්‍රය තුළ නව්‍ය විසඳුම් හඳුනාගැනීම සහ ප්‍රවර්ධනය කිරීමයි.

2. මෙම වසරේදී මෙම අභියෝගය විසින් ශ්‍රී ලංකාව, ඕස්ට්‍රේලියාව, පැපුවා නිව් ගිනියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සවුදි අරාබිය සහ තවත් රටවල් රැසක් ඇතුළත් වන ආසියා පැසිෆික් කලාපයේ ප්‍රමුඛ පෙළේ ආරම්භක සමාගම් 20ක් හඳුනා ගන්නා ලදි. එලෙස තෝරා ගන්නා ලද සමාගම් විස්සෙන් හතරක් ශ්‍රී ලංකාවේ සමාගම් වේ. ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය විසින් ඉන්වෙස්ට් ඉන්ඩියා සහ ජාත්‍යන්තර සූර්ය බල සන්ධානය හා එක්ව මෙම වසර මුලදී සංවිධානය කළ වැඩමුළුවක දී මෙම අභියෝගය ආරම්භක සමාගම් වෙත හඳුන්වා දෙන ලදි.

3. ශ්‍රී ලංකාවෙන් ජයග්‍රහණය කළ පහත දැක්වෙන සමාගම් සඳහා ඇමරිකානු ඩොලර් 15,000ක ප්‍රදානයක් සමඟ උපදේශකත්වය, ආයෝජක සබඳතා සහ වෙළෙඳපොළ ප්‍රවේශ අවස්ථා ඇතුළු වේගවත්කරණ සහයෝගය හිමි වේ.

| ආරම්භක සමාගම | විස්තර |
|---|---|
| බයෝ ලංකා එක්ස්පෝට්ස් (පුද්.) සමාගම | බයෝ ලංකා එක්ස්පෝට්ස් සමාගම නේවාසික සහ වාණිජ අවශ්‍යතා සඳහා අමුද්‍රව්‍ය භාවිතය සහ ඉදිකිරීම් අපද්‍රව්‍ය අවම කරමින් පරිසර හිතකාමී, සූර්ය බලයෙන් බලගැන්වූ කන්ටේනර් නිවාස ලබා දෙයි. |
| මැජික්බිට් (පුද්.) සමාගම | මැජික්බිට් සමාගම ඉහළ පරිමාකරණය සහ තත්කාලීන දෘශ්‍යතාවය සඳහා සූර්ය බලශක්තිය, IoT ඒකාබද්ධ කිරීම, cloud සහ කෘත්‍රිම බුද්ධි තාක්ෂණය සඳහා open-source, තත්කාලීන අධීක්ෂණ සහ analytics වේදිකාවක් ලබා දෙයි. |
| සින්ටැක්ස් ජෙනී (පුද්.) සමාගම | සින්ටැක්ස් ජෙනී සමාගමේ කෘත්‍රිම බුද්ධියෙන් බලගැන්වූ වේදිකාව |

| | |
|---|---|
| | පරිමාකරණය කළ හැකි සහ තිරසාර විසඳුම් සමඟින් ආසියා-පැසිෆික් ප්‍රදේශවල බලශක්ති දුගීබවට විසඳුම් ලබාදීම සඳහා සූර්ය බලශක්ති කුඩා ජාල කළමනාකරණය ප්‍රශස්තකරණය කරයි. |
| බ්ලුව්ප්ප ටෙක්නොලොජීස් ඒෂියා | බ්ලුව්ප්ප ටෙක්නොලොජීස් ඒෂියා සමාගම ස්ථාන තෝරාගැනීම සහ සැලසුම්කරණය කාර්යක්ෂමව සිදුකෙරෙන බව සහතික කරමින් සූර්ය බල ව්‍යාපෘතීන් සමස්ත ජීවන චක්‍රය හරහා ප්‍රශස්තකරණය කිරීමට කෘත්‍රිම බුද්ධිය, IoT, GPS සහ ඩ්‍රෝන තාක්ෂණය උපයෝගී කර ගනී. |

4. ඉන්වෙස්ට් ඉන්ඩියා විසින් SolarX Startup Challenge වැඩමුළුවේ දෙවෙන වටය 2024 දෙසැම්බර් 12 වන දින කොළඹ දී සංවිධානය කරනු ලබයි. මෙම භෞතික වේගවත්කරණ වැඩමුළුව උපදේශකත්ව සැසි, අන්තර්ක්‍රියාකාරී සාකච්ඡා සහ ව්‍යාපාරික අවස්ථාවන් සමඟින් පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළආරම්භක සමාගම් තවදුරටත් බලගැන්වීම සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහනක් වනු ඇත. ආරම්භක සමාගම් සඳහා දේශීය පරිසර පද්ධතිය පිළිබඳ අත්දැකීම් ලබා දෙමින් ශ්‍රී ලංකාවේ සූර්ය සහ පුනර්ජනනීය බලාගාර වෙත ක්ෂේත්‍ර චාරිකා ද මෙයට ඇතුළත් වනු ඇත.

***

**කොළඹ**

***2024 දෙසැම්බර් 11***